# Inquiry into the terminologies of *puñña-pāpa*, (Merits and Demerits) and *kusala-akusala* (Wholesome and Unwholesome)

පුඤ්ඤ-පාප හා කුසල අකුසල යන පද පිළිබඳ විමර්ශනයක්

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

**Abstract**

One of the most frequently discussed terms in the ethical aspects of Buddhism is *puñña-pāpa* and *kusala* - *akusala*. The term *puñña-pāpa* here can be traced back to the religious background from the pre-Buddhist era. But the terms *kusala* and *kusala* are found exclusively in Buddhism. The question that arises here is whether the above words have a similar meaning or whether there is any difference between them. Scholars have differing views on this subject. I think some positive answer to the above problem can be found in the study of ancient Buddhist teachings and commentaries. Accordingly, in the commentary, there are instances where the above *puñña* - kusala and *pāpa* -akusala are synonymous. But in the conceptual interpretations of those terms, we can see how the term of happiness and misery are interpreted in the material world through the term of *pāpa* -akusala. Also, the terms *kusala* - *akusala* are often found in commentaries on the Buddhist concept of Nirvana.

Key words - *puñña-pāpa, kusala* – *akusala*, Existence, Enlightenment

**සාරසංක්ෂේපය**

බුදුසමයේ ආචාරවිද්‍යාත්මක පැතිකඩ තුළ බොහෝ සෙයින් සාකච්ඡා වන පද යුගලද්වයක් ලෙස පුඤ්ඤ- පාප කුසල අකුසල යන්න යෙදී ඇත. මෙහි පුඤ්ඤ-පාප පද ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් ආගමික පසුබිම තුළ දැකගත හැක්කකි. නමුත් කුසල-අකුසල පද සුවිශේෂ වශයෙන් හමුවන්නේ බුදුසමයෙනි. උක්ත පද යුගලද්වයෙන් සමාන වූ අර්ථයක් ඉදිරිපත් වේද එසේ නොමැති ද යන්න සෙවිය යුතු වේ. මේ පිළිබඳ වියතුන් විසින් විවිධ වූ මත ඉදිරිපත් කොට ඇත. ආදි බෞද්ධ ඉගැන්වීම් හා අටුවා විවරණ අධ්‍යයනය කරණ විට උක්ත ගැටලුව සඳහා යම් සාධනීය පිළිතුරක් ලබාගත හැකිවේයැයි සිතේ. ඒ අනුව අටුවාව ඇතැම් තැන්හි උක්ත පුඤ්ඤ-කුසල පද හා පාප-අකුසල පද සමානාර්ථයෙන් දක්වා ඇති අවස්ථා හමුවේ. නමුත් එම පද සංකල්පීය විවරණයන් තුළ දැකගත හැක්කේ පුඤ්ඤ-පාප පද

වලින් පුද්ගල සාංසාරිකත්වය තුළ සුඛ දුක්ඛ තත්ත්වයන් විවරණය කොට ඇති ආකාරයයි. එසේම කුසල හා අකුසල පද බෞද්ධ නිර්වාණ විග්‍රහය හා සම්බන්ධ විවරණ තුළ බොහෝ සෙයින් හමු වේ.

**ප්‍රමුඛපද** ; පුඤ්ඤ, පාප, කුසල, අකුසල, සසර, නිවන.

## හැඳින්වීම

බුදුසමයේ ආචාර විද්‍යාත්මක පැතිකඩ පිළිබඳ අධ්‍යයනයේ දී සාකච්ඡාවට භාජනය වන කරුණක් ලෙස පුඤ්ඤ-පාප, කුසල-අකුසල පිළිබඳ ඉගැන්වීම් හඳුනා ගැනෙයි. විශේෂයෙන් මේ පිළිබඳ සාකච්ඡාවන් නිර්මාණය වී ඇත්තේ උක්ත පදයන් පිළිබඳ විද්වත් ලෝකයේ ප්‍රකට වන්නා වූ විවිධ අර්ථ විවරණ පදනම්ව ය. ඇතමෙක් "පුඤ්ඤ" හා "කුසල" පද හා "පාප" හා "අකුසල" පද සමානාර්ථයෙන් විවරණය කිරීමට උත්සාහ ගෙන ඇත. එසේම තවත් බොහෝ පිරිසක් මෙම පද තුළ දැකගත හැකි වෙනස් අර්ථයන් පෙන්වා දීමට උත්සහ ගෙන ඇත. ඔවුන් අතර මහාචාර්ය කේ. ඇන්. ජයතිලක, මහාචාර්ය පී. ඩී. ප්‍රේමසිරි, මහාචාර්ය ගුණපාල ධර්මසිරි ආදීහු ඉතා ප්‍රකට ය. සූත්‍ර දේශනාවන් අධ්‍යයනය කිරීමෙන් පුඤ්ඤ-පාප, කුසල අකුසල පදයන්ගේ ආදි බෞද්ධ ඉගැන්වීම් තුළ භාවිතය හා අර්ථ දැක්වීම් පිළිබඳ නිවැරදි අදහසක් ලබාගත හැකි ය. මෙම අධ්‍යයනයෙන් උක්ත පද පිළිබඳ මූලාශ්‍රය නයින් කරුණු විමර්ශනය කෙරෙයි.

## පර්යේෂණ ක්‍රමවේදය

සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය කිරීම මගින් තොරතුරු ඒකරාශී කිරීම පර්යේෂණයේ මූලික ක්‍රමවේදය වෙයි. ග්‍රන්ථ සන්ධාර ක්‍රමයට අනුගතව මෙම පර්යේෂණය ප්‍රාථමික මූලාශ්‍රය පරිශීලනය, ද්විතික මූලාශ්‍රය පරිශීලනය, සඟරා හා කෝෂ ග්‍රන්ථ පරිශීලනය, අන්තර්ජාල පරිශීලනය යන ක්‍රමවේදයන් ඔස්සේ සිදුකොට ඇත.

## සාකච්ඡාව

පුඤ්ඤ-පාප, කුසල-අකුසල පදයන් තුළින් දැක්වෙන අර්ථයන්ගේ වෙනස පැහැදිලි කරගැනීමට එම පදයන් විග්‍රහ වී ඇති ආකාරය වෙන වෙනම ගෙන බැලීම වැදගත් වේ.

### පුඤ්ඤ

බුදුසමය තුළ මිනිසාගේ සදාචාරාත්මක චර්යාවන් හා මනෝභාවයන් හැඳින්වීම සඳහා යොදා ඇති ඇගයුම්ශීලි පදයන් අතුරෙන් "පුඤ්ඤ" පදය පාලි සාහිත්‍යයේ විශේෂ වශයෙන් යෙදී ඇත. මේ පිළිබඳ අර්ථ විමසීමේ දී රීස් ඩේවිඩ්ස් හා විලියම් ස්ටිඩ් දෙදෙනා ඔවුන් විසින් සංස්කරණය කරන ලද පාලි ඉංග්‍රීසි ශබ්ද කෝෂයෙහි මේ සඳහා merit, meritorious action, virtue යන වචන ඉදිරිපත් කොට ඇත. එහි ස්වභාවය විස්තර කරන්නා වූ ඔවුන් always represented as foundation and condition of heaven (Dictionary of Pali and English, P.T.S.; P.464). යනුවෙන් එය අර්ථ දක්වා ඇත. එසේම මෝනියර්

විලියම් ඔහුගේ සංස්කෘත ඉංග්‍රීසි ශබ්ද කෝෂයෙහි "පුණ්‍ය" යන්න අර්ථ දැක්වීමේ දී Good, Pure, holy, right, righteous, virtuous, just, sacred, happy, prosperous, favourable, propitious, auspicious, luky, bright, fine, beautiful, pleasing, sweel, fragrant, solemn, festive, ferial යනුවෙන් වචන රාශියක් ඉදිරිපත් කරයි. (Williams, Sanskrit English Dictionary; P. 632).

බුදුසමය තුළ පුඤ්ඤ පදයෙහි භාවිතය පිළිබඳ අධ්‍යයනයේ දී විශේෂයෙන් නිකාය ග්‍රන්ථයන්හි හා අටුවා විවරණයන් තුළ පුඤ්ඤ යන්නෙහි ප්‍රතිඵලය පුද්ගලයා තුළ සතුටුදායක තත්ත්වයක් නිර්මාණය කරන්නක් ලෙස බොහෝ තැන්හි හමුවේ. "***ඉධ නන්දති පෙච්ච නන්දති කත පුඤ්ඤො උභයත්ථ නන්දති***" (ධම්මපද පාලි, පි 28). මේ නිසා විමානවත්ථු අට්ඨකථාවෙහි ධම්මපාල හිමියන් "පුඤ්ඤ" යන්න අර්ථ දක්වා ඇත්තේ සන්තානය පිනවන පිරිසිදු කරන දෙයක් වශයෙනි. ***සන්තානං පුනාති විසොධෙතීති ච පුඤ්ඤන්ති*** (පරමත්ථදීපනී, වි.ව.අ.; පිට 15). ධම්මපාල හිමියන්ගේ විවිරණයන්ට අනුව පුඤ්ඤ කර්මයන්හි ප්‍රතිඵලය සතුටුදායක තත්ත්වයක් හෝ සන්තානගත ප්‍රබෝධයක් ඇති කරන්නක් වුව ද එය මුළුමනින්ම පුද්ගල සන්තානගත ක්ලිෂ්ට භාවය ඉවත් කරන්නක් වශයෙන් පිළිගැනීමට අපහසු වේ.

ම.නි. චත්තාරීසක සූත්‍රයේ පුඤ්ඤක්‍රියා හඳුන්වන්නේ ආශ්‍රව සහිත (සාසවා) මතුවිපාක ලබාදෙන (උපධිවෙපක්ක) තත්ත්වයක් වශයෙනි. (ම.නි. 03, මහාචත්තාරීසක සුත්ත; පිට 212). එසේම ආදි බුදුසමයට අනුව පුද්ගලයා පුඤ්ඤ කර්ම (පුඤ්ඤාභිසංඛාර) රැස්කරනුයේ අවිද්‍යාව හේතුවෙනි. (ස.නි. 02, පරිවීමංසක සුත්ත; පිට 130). පුද්ගලයා තුළ භව තෘෂ්ණාව ඉවත්ව නොමැති වූ විට තවදුරටත් ආත්මීය සංකල්පනාවෙන් යුක්තව පුඤ්ඤ කර්ම රැස් කරයි. (අභිසංඛරොති) සාංසාරික වශයෙන් සුගති සංඛ්‍යාත භවයක උපත ලැබීමට හේතුවන නමුත් පාප කර්මවල නිරතවීමේ දී මෙන් පුද්ගලයා කායික වාචසික හා මානසික වශයෙන් කිලුටට පත්වීමක් පුඤ්ඤ කර්ම මඟින් සිදු නොවේ. විශේෂයෙන් පුද්ගලයා රාගයෙන් ද්වේෂයෙන් රත්වීමක් එයින් සිදු නොවේ.

බුදුසමය තුළ "පුඤ්ඤ" යන පදය විවරණය වී ඇති අයුරු තවදුරටත් අධ්‍යයනය කිරීමේ දී අර්ථකථන සම්ප්‍රදායන් තුළ එය සංවර්ධනයට ලක් වී ඇති අයුරු දැකගත හැකිය.

**පුඤ්ඤන්ති ලද්ධනාමං සුචරිතං කුසලකම්මං** (සුචරිත වූ කුසල කර්ම පුඤ්ඤ නම් වේ). (පරමත්ථදීපනී වි.අ.; පිට 15).

**පුඤ්ඤන්ති දානාදි කුසල කම්මං** (දානාදි කුසල කර්ම පුඤ්ඤ නම් වේ). (පරමත්ථදීපනී ඉ.අ.; පිට 60).

**පුබ්බෙති පුරා අතීතාසු ජාතීසු කතපුඤ්ඤතානි උපචිතකුසලා** ("පුබ්බ" යනු පෙර අතීත ජාතීන්හි, " කතපුඤ්ඤ" යනු රැස් කරන ලද කුසල් ය). (පරමත්ථජොතිකා සු.නි.අ.; පිට 253).

**පුඤ්ඤාභිසන්දාති පුඤ්ඤස්ස අභිසන්ද පුඤ්ඤොපපත්තියාති අත්ථො කුසලාභිසන්දාති තස්සේව වෙවචනං** ("පුඤ්ඤාභිසන්ද" යනු පින් රැස්කිරීමයි. පින් ඉපදවීම යන අර්ථයයි. "කුසලාභිසන්ද" යනු එයට ම පරියාය පදයකි). (මනොරථපූරණී අ.නි.අ.; පිට 513).

**පුඤ්ඤතෙජොති විපස්සනාහි ලද්ධපතිට්ඨො අරියමග්ග කුසලතෙජො** ("පුඤ්ඤතෙජ" යනු විපස්සනාවෙන් ලබන ලද ප්‍රතිෂ්ඨා ඇති ආර්ය මාර්ග කුසල තේජසයි. (සද්ධම්මප්පකාසිනී ප.අ.; පිට 224).

**පුඤ්ඤාභිසංඛාරො කුසලචේතනා කාමාවචරා රූපාවචරදානමයසීලමයභාවනාමයා** ("පුණ්‍යාභිසංස්කාර" යනු කාමාවචර රූපාවචර දානමය සීලමය භාවනාමය කුසල චේතනාය). (සුමංගල විලාසිනී දී.නි.අ.; පිට 729).

**පුඤ්ඤං අප්පකං කතන්ති අප්පකං පරිත්තං මයා කුසලකම්මං කතං** (අල්පවූ පිනක් කරන ලදැයි යනු මා විසින් අල්ප වූ කුසල කර්මයක් කරන ලදි යනුයි). (පරමත්ථදීපනී පෙ.ව.අ.; පිට 37).

**පුඤ්ඤානි කරොන්තානි බුද්ධඤ්ච ධම්මඤ්ච සංඝඤ්ච ආරබ්භ දානප්පදානානි සුගතිමග්ගසංසොධකානි කුසලකම්මානි කරොන්තො** (පින් කිරීම යනු බුද්ධ ධම්ම සංඝ අරභයා දන්දීමාදි සුගති මාර්ගය සෝධනය කරන කුසල කර්ම කිරීම ය. (ම.නි.අ.; පිට 201).

මෙම විවරණයන්ට අනුව පුඤ්ඤ හා කුසල යන පදයන් අටුවාචාරීන් වහන්සේලා සමානාර්ථයෙන් සලකා ඇති බව පෙනේ. එසේම මෙම පුඤ්ඤ හා කුසල යන්න අටුවා විවරණයන් තුළ ලෞකික හා ලෝකෝත්තර වශයෙන් වර්ග කොට විවරණය කොට ඇති අයුරු ද දැකගත හැකි වේ. ***එවමිදං පුඤ්ඤං පවඩ්ඪති එවං ඉදං ලොකිය ලොකුත්තරපුඤ්ඤඵලං වඩ්ඪති*** (මෙසේ පින් වර්ධනය කිරීම යනු ලෞකික ලෝකෝත්තර පුණ්‍ය ඵල වැඩීමයි). (සුමංගලවිලාසිනි දී.නි.අ.; පිට 614). **බහුං පුඤ්ඤං පසවති ලොකිය ලොකුත්තර මිස්සකං පුඤ්ඤං කථිතං** (බොහෝ පින් රැස් කිරීම යනු ලෞකික ලෝකෝත්තර මිශ්‍ර පින් කියන ලදි). (මනෝරථපූරණී අ.නි.අ.; පිට 342). ***සංඛාරා ලොකිය කුසලාකුසල චෙතනා*** (සංස්කාර යනු ලෞකික කුශලාකුශල චේතනාය). (පරමත්ථදීපනී උ.අ.; පිට 28).

මෙසේ අටුවා විවරණයන් තුල පුඤ්ඤ හා කුසල පදයන් සමානාර්ථයෙන් දක්වා ඇති නමුත් ඒවා සංකල්පීය වශයෙන් වෙනසක් පවතින බව අටුවාචාරීන් වහන්සේ මුළුමනින් ම අමතක කොට නොමැත. සුමංගලවිලාසිනී දීඝනිකාය අටුවාවෙහි දී බුද්ධඝෝස හිමියන් කුසල යන්න වර්ග කරමින් කුසලය වට්ටගාමිනී විවට්ටගාමිනී වශයෙන් දෙපරිදි බව දක්වයි. එහි වට්ටගාමිනී කුසලය යනු මව්පියන් විසින් දූ දරුවන් කෙරෙහි ද දූ දරුවන් විසින් මව්පියන් කෙරෙහි ද ස්නේහ වශයෙන් පවතින මුදු මද්දව සිතයි. විවට්ටගාමිනී කුසල යනු සතර සතිපට්ඨානාදී සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් ය. ඒ අනුව වට්ඨගාමිනී කුසලය අවසානයේ දී මනුෂ්‍ය ලෝකයෙහි චක්‍රවර්ති රාජ්‍ය ශ්‍රී විභවය පිණිස වේ. විවට්ටගාමිනී කුසලය අවසානයේ දී මාර්ගඵල සංඛ්‍යාත නිර්වාණය පිණිස වේ. (සුමංගලවිලාසිනි දී.අ.; පිට 614). මෙහි දී ද බුද්ධඝෝෂ හිමියෝ කුසල පදය පුඤ්ඤ පදය හා සමානව යොදා ඇති අයුරු දැකගත හැකි වේ. නමුත්

ඒ තුළ දැකගත හැකි සංකල්පීය වෙනස ද උන්වහන්සේ විවරණය කරනු ලබයි. පශ්චාත්කාලීන පාලි ධර්ම ග්‍රන්ථ රචකයන් විසින් ද මෙම අර්ථවිවරණයන් අනුගමනය කොට ඇති බැවින් සාමාන්‍ය පොදු ජනතාව අතර පමණක් නොව සාම්ප්‍රදායික උගතුන් අතර ද පුඤ්ඤ හා කුසල පදයන් වෙනස් අදහස් ඇති පද දෙකක් ලෙස පිළිගත් බවක් දැකගත නොහැක. නිදසුන් ලෙස වර්තමාන බුද්ධ ජයන්ති ත්‍රිපිටක පරිවර්තන විමසීමේ දී ***බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ පුඤ්ඤං පසවන්ති*** යන්න "මහණෙනි ඒ මහණහු බොහෝ කුසල් ද රැස් කෙරෙත්" යනුවෙන් දක්වයි. (අ.නි. 1; පිට 137). ධම්මපදයේ එන ***මා පමඤ්ඤේථ පුඤ්ඤස්ස න මංතං ආගමිස්සති*** යන්න "ඒ ස්වල්ප මාත්‍ර කුසල කර්මය මා කරා නොඑන්නේ යැයි අවමන් නොකරන්නේ ය" යනුවෙන් ද අර්ථ විවරණ කොට ඇති අයුරු දැකගත හැකි ය.

**පාප**

පුඤ්ඤ යන්නට ප්‍රතිවිරුද්ධ වූ සියලුම ක්‍රියා "අපුඤ්ඤ" හෙවත් "පාප ක්‍රියා" ලෙස සලකනු ලබයි. පාප යන පදයට සමානව බෞද්ධ සාහිත්‍යයේ යෙදී ඇති පද රාශියක් හමු වේ. කිබ්බිසං, වෙරං, අසං, දුච්චරිතං, අපුඤ්ඤං, අකුසලං, කණ්හං, කලුසං, දුරිතං, ආගු. ***පාපං (ච) කිබ්බිසං වෙරා'සං දුච්චරිතං දුක්කතං අපුඤ්ඤා' කුසලං කණ්හං කලුසං දුරිතා'ගු (ච)*** (අභිධානප්පදිපිකාව, ඤාණොභාසතිස්ස ස්ථවිර එම්, නව මුද්‍රණය; 87 ගාථාව; පිටු 18). ඒ අතර කිහිපයකි. මේ හැරුණු විට පාපි හැසිරීම් විස්තර කිරීමට "ආමගන්ධ" යන පදය ද අකරණීයං, අසුචි, අනරියං, හීන යන පදයන් ද යෙදී ඇති අයුරු පාලි සාහිත්‍යයේ දැකගත හැකි ය. (සද්ධාසේන ඩී. මුල් බුදුසමයේ ඉගැන්වෙන පාප සංකල්පය; පිට 35). මහානිද්දේස පාලිය පුඤ්ඤ යන්නෙහි විරුද්ධාර්ථය වූ පාප හෙවත් අපුඤ්ඤ යන්න විවරණය කර ඇත්තේ සියලු අකුසල් ලෙසිනි. ***අපුඤ්ඤං වුච්චති සබ්බං අකුසලං*** (සියලු අකුසල අපුඤ්ඤ යැයි කියනු ලැබේ). මහානිද්දේසපාලි. පිට 124). මේ අනුව අපුඤ්ඤ යනු සියලු අකුසල ධර්මයෝ ය. සුමංගල විලාසිනි දීඝනිකාය අටුවාවෙහි බුද්ධඝෝස හිමියන් විසින් ***තත්ථ කතමො අපුඤ්ඤාභිසංඛාරො අකුසල චෙතනා කාමාවචරා අයං වුච්චති අපුඤ්ඤාභිසංඛාරො*** (එහි අපුඤ්ඤාභිසංකාර යනු කවරේ ද කාමාවචර අකුසල චේතනා අපුඤ්ඤාභිසංඛාර යැයි කියනු ලැබේ). (සුමංගලවිලාසිනී දී.නි.අ.; පිට730). යනුවෙන් අපුඤ්ඤාභිසංඛාර අර්ථකථනය කොට ඇත. මේ අනුව අපුඤ්ඤ යනු කාමාවචර අකුසල චේතනාය. විසුද්ධිමාර්ගයේ අපුඤ්ඤ යනුවෙන් ඉදිරිපත් කොට ඇත්තේ ද්වාදස අකුසල චේතනා ය. ***අපුඤ්ඤාභිසංඛාරො පාණාතිපාතාදිවසෙන පවත්තා ද්වදසඅකුසලචේතනා*** ප්‍රාණඝාතාදි වශයෙන් පවත්නා ද්වාදශ අකුසල චේතනා අපුඤ්ඤාභිසංඛාරයෝ ය. (විසුද්ධිමග්ග; පිට. 412). මෙසේ පෙල ග්‍රන්ථ තුළ අපුඤ්ඤ යනුවෙන් පාප හා අකුසල ක්‍රියා අදහස් කොට ඇති නමුත් පාප හා අකුසල යන පදයන් අතර වෙනසක් දැකගත හැකි ය. ඒ අනුව සෑම අකුසල ක්‍රියාවක් ම පාප ක්‍රියාවක් වශයෙන් සැලකීමට හැකියාවක් නොමැත. නිදසුනක් වශයෙන් සම්මත සදාචාර සීමා යටතේ විවාහ ජීවිතයේ දී ලබන ලිංගික ආශ්වාදය පාපයක් නොවන නමුත් එය නිර්වාණාවබෝධයට බාධාකාරී බැවින් අකුසල සංඛ්‍යාවෙහි සලකනු ලබයි. එසේම බුදුසමය අනුව සියලු පුඤ්ඤ, පාප, අකුසල චර්යාවන් අවිද්‍යාව මූලිකව සිදුවන අතර සියලු කුසල ක්‍රියා පමණක් විද්‍යාව මත පදනම්ව පවතී.

නමුත් මෙහිදී පුඤ්ඤ හා කුසල අතර පවතින වෙනස පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සියලුම කුසල ක්‍රියා එක් අංශයකින් පුඤ්ඤ වශයෙන් පිළිගැනීමට හැකියාව ඇත. කුසලය වැඩීමෙන් පින් රැස්වෙන බව බොහෝ සූත්‍ර දේශනා තුළ දැක්වේ. ***එවං දීඝරත්තානං කතානං කුසලානං පරියන්තං නාධිගච්ඡාමි එත්තකං පුඤ්ඤන්ති වා එත්තකං පුඤ්ඤවිපාකොති*** වා (මෙසේ දිගු කලක් කල කුසල්වල පින මෙතෙකැයි කියා හෝ පුණ්‍ය විපාකය මෙතකැයි කියා හෝ කෙළවරක් නොදනිමි) (ස.නි. 1, සෙරි සුත්ත; පිට 114). ***කුසලානං භික්ඛවෙ ධම්මානං සමාදානහේතු එවමිදං පුඤ්ඤං පවඩ්ඪන්ති*** (මෙසේ කුසල ධර්මයන්ගේ සමාදාන හේතුවෙන් පින් ද වැඩේ). (දී.නි. 3, චක්කවත්තිසීහනාද සුත්ත; පිට 134), ***කුසලෙන කායකම්මෙන කුසලෙන වචීකම්මෙන කුසලෙන මනෝකම්මෙන ඉමෙහි ඛො භික්ඛවෙ.... බහුඤ්ච පුඤ්ඤං පසවති.*** (කුසල කාය කර්මයෙන් කුසල වචී කර්මයෙන් කුසල මනෝ කර්මයෙන් මේ තුන් දහමින් බොහෝ පින් ද රැස්කෙරෙයි). යන නිදසුන් මඟින් ඉහත අදහස සනාථ කොට ඇත.

එසේම සාංසාරික පැවැත්ම තුළ පුද්ගලයා වින්දනය කරනු ලබන සුවදායක අත්දැකීම් පුඤ්ඤ යටතේ දක්වන අතර එය නිර්වාණය සඳහා අවශ්‍ය කුසල ප්‍රතිපදාව වැඩීමට පදනම සකස් කර දෙයි. නිවන් අවබෝධය සඳහා අවශ්‍ය සුගති සංඛ්‍යාත භවයක උපත පිණිස හේතුවන්නේ පුඤ්ඤ ප්‍රතිපදාව යි. එබැවින් පුඤ්ඤ සාංසාරික සන්දර්භය තුළ කුසලය සඳහා අත්‍යවශ්‍ය වූවක් බව සැලකිය හැක.

## කුසල

ආචාරවිද්‍යාත්මක ඇගයුම් සඳහා යොදන්නා වූ පදයන් අතුරින් අර්ථමය හා සංකල්පීය වශයෙන් බුදුසමයට පමණක් ආවේණික වූ ලක්ෂණයන්ගෙන් යුක්ත පද යුගලයක් ලෙස කුසල -අකුසල යන පද භාවිත වේ. මෙම පදවල වාච්‍යාර්ථ පිළිබඳ විමසා බැලීමේ දී මූලික පිටක ග්‍රන්ථවල හා අටුවා ග්‍රන්ථවල යෙදී ඇති අර්ථ ඉතා වැදගත් වේ. අටුවාචාරී බුද්ධඝෝස හිමියෝ සුමංගල විලාසිනි දීඝනිකාය අට්ඨකථාවෙහි ආරෝග්‍ය, අනවජ්ජ, කොසල්ලසම්භූත, නිද්දරථ, සුඛ විපාක යනුවෙන් අර්ථ පහක් ද, (සුමංගලවිලාසිනි දී.නි.අ.; පිට 642). අත්ථසාලිනී ධම්මසංගනී අටුවාවෙහි ආරෝග්‍ය, අනවජ්ජ, ඡෙක, සුඛ විපාක වශයෙන් අර්ථ හතරක් ද (අත්ථසාලිනි ධ.ස.අ.; පිට 62). කුසල යන පදය සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇත. සුමංගලවිලාසිනියට අනුව කුසල යන්නට අර්ථ පහක් ඉදිරිපත් වන්නේ සුත්තන්තපරියාය, අභිධම්පරියාය හා ජාතකපරියාය පදනම් කරගෙනය. මූලික පිටක ග්‍රන්ථවල කුසල යන වචනය යෙදී ඇති සන්දර්භයන් විමසා බැලීමෙන් බුද්ධඝෝස හිමියන්ගේ අර්ථ විවරණ හඳුනාගැනීම පහසු වේ. ඒ අනුව කුසල යන්නට පර්යාය වශයෙන් ඉදිරිපත් කරන නිරෝග හෙවත් ආරෝග්‍ය යන්න පෙළ ග්‍රන්ථවල යෙදී ඇති අයුරු රාශියක් දැකගත හැකි ය.

***ආරොගය කුසලං*** (ආරෝග්‍ය අර්ථයෙහි කුසල ශබ්දය වේ). (අභිධානප්පදීපිකා - 111,).

***සුඛං ච කුසලං පුච්ඡති*** (සුවය ද නිරෝගි බව ද විචාරයි). (සු.නි. 306).

***උපෙච්ච වන්දිම් කුසලං ච පුච්ඡිස්සං*** (වෙත පැමිණ වැන්දෙමි. නිරෝගී බව ද විචාළෙමි). (විමාන. ව. 114).

***(කච්චින්නු භො භොතො කුසලං කච්චි භොතො අනාමයං*** භවත්නි). (ඔබගේ ආරෝග්‍ය කෙසේ ද සුවදුක් කෙසේ ද). (ජාතක 6-219).

***කුසලන්ති ආරොග්‍යං*** (කුසල යනු නිරෝගී බවයි). (ජාතක -6 220).

දෙවන අර්ථය වන **අනවජ්ජ** හෙවත් නිවැරදි යන්න යෙදී ඇති අවස්ථා ද එසේම දැකගත හැකි ය. ***කුසලො අනවජ්ජම්හි*** (අනවද්‍ය අර්ථයෙහි කුසල ශබ්දය වේ). (අභිධානප්පදීපිකා. 803).

***යාවතතියං සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය සංඝාසෙසො (***ඉදින් තුන්වන වර දක්වා සමනුභාසන කර්මය කරනු ලබන්නේ ඒ ලබ්ධිය හැරපියා නම් මෙසේ මේ හැරපීම මැනවි. ඉදින් නොහැරපියා නම් සඟවෙසෙස් වේ). (පාරාජිකා. 462.

***තදෙව කම්මං කුසලං කතං මයා*** (මා විසින් ඒ කුසල කර්මය පමණක් කරන ලදි). (විමානවත්ථු. 64).

***කාහාමි කුසලං කම්මං යෙන ගච්ඡාමි සුග්ගතිං*** (යමකින් සුගතියට යම් ද එම කුසල කර්මය කරමි). (ජාතක. 6- 327).

***තව වචනං කුසලං අනවජ්ජං*** (ඔබගේ වචනය යහපත් ය. නිරවද්‍යය ය). (ජාතක. 7-156).

***කිං කුසලං කරෙය්‍යාම යන්නූන මයං පාණාතිපාතා විරමෙය්‍යාම ඉදං කුසලං ධම්මං සමාදාය වත්තෙය්‍යාමාති*** (කවර කුසලයක් කරන්නෙමු ද අපි ප්‍රාණඝාතයෙන් වලකින්නෙමු නම් මේ කුසල් දහම සමාදන් කොටගෙන පවතින්නෙමු නම් යෙහෙකැයි). (දී.නි. 3-122).

***කුසලං භික්ඛවෙ භාවෙථ*** (මහණෙනි කුසලය වඩන්න). (අ.නි. 1-116).

මීට අමතරව "දක්ෂ" යන අර්ථය ද කුසල පදය සඳහා යෙදී ඇති අවස්ථා බුද්ධඝෝස හියමින් පෙන්වා දී ඇත.

**කුසලො ඡෙකො** (දක්ෂය යන අර්ථයෙහි කුසල අර්ථයෙහි කුසල ශබ්දය වේ). (අභිධානප්පදීපිකා. 803).

***කුසලො ත්වං පුබ්බෙ අගාරිකභූතො වීණාය තන්තිස්සරෙ (***ඔබ පෙර ගිහි වූයේ වීණා වාදනයෙහි දක්ෂ වූයේ වෙහිද). (මහාවග්ග. 1-180).

***කුසලො භො අහං දිට්ඨධම්මිකානං අත්ථානං*** (මම වනාහි මෙලොව වැඩ පිණිස පවතින අර්ථයෙහි දක්ෂ වෙමි). (දී.නි. 2 -364).

***කුසලො ත්වං රථස්ස අංගපච්චංගෙති*** (ඔබ රථයෙහි අවයව පිළිබඳ දක්ෂ වූයේ වේද). (ම.නි. 2-96).

***කුසලො ත්වං රාජගහගාමිස්ස මග්ගස්සාති*** (ඔබ රජගහ නුවර කරා යන මඟ කියන්නට දක්ෂ වූයේ වෙහි ද). (ම.නි. 3-94).

***පණ්ඩිතො වියත්තො කුසලො සූදො*** (පණ්ඩිත වූ ව්‍යක්ත වූ දක්ෂ වූ අරක්කැමියෙක්). (ස.නි. 5;1; 274).

***පාපණිකො කුසලො හොති පණියං කෙතුං ච වික්කෙතුං ච*** (වෙළඳ තෙමෙ වෙළඳ බඩු මිලට ගන්නට හා විකුණන්නට දක්ෂවේ ද). (අ.නි. 1; 220).

සිව්වන අර්ථය බුද්ධඝෝස හිමියන් ඉදිරිපත් කරන්නේ අභිධර්ම සම්ප්‍රදායට අනුව ය. එයින් කොසල්ලසම්භූත හා සුඛ විපාක යන අරුත් සම්බන්ධයෙන් ගැටලුවක් නොමැත. එම වචන එම අර්ථයෙන් ම මූලික පෙළ ග්‍රන්ථවල යෙදී තිබේ. නමුත් "නිද්දරථ" යන වචනය යෙදීමෙහි විශේෂත්වයක් තිබේ. එයින් අදහස් කෙරෙන්නේ කෙලෙස් රහිත බවයි. කුසල යන්න හැඳින්වීම සඳහා මෙම යෙදීම භාවිත කරනුයේ බුද්ධඝෝස හිමියන් විසින් පමණි. මහානාම හිමියන් විසින් රචිත පටිසම්භිදාමග්ග අට්ඨකථාවෙහි නිද්දරථ යන්න සඳහා "උපසමට්ඨොති නිද්දරථට්ඨො" "අසාරධොති නිද්දරථො" යනුවෙන් නිද්දරථ යන්න හැඳින්වීම සඳහා උපසම, අසාරධ යන වචන දෙක යොදාගෙන තිබේ.

කෙසේ වෙතත් කුසල යන පදය වෙනුවට පරියාය පදයක් වශයෙන් නිද්දරථ යන්න මුල් වරට යොදාගනු ලබන්නේ බුද්ධඝෝස හිමියන් විසින් පමණි. මෙම පර්යාය පදය පසුව එන අටුවාචාරීන් වහන්සේ විසින් තවදුරටත් සංවර්ධනය කොට ඇත. කුසල යන්න සඳහා ඉදිරිපත් කෙරෙන සුඛ විපාක යන්න යෙදී ඇති අවස්ථා ද පිටක ග්‍රන්ථයන් හි දී හමු වේ.

***තං කම්මං කත්වා කුසලං සුඛුද්‍රයං*** (කුසල් වූ සුව වඩන ඒ කර්මය කිරීමෙන්). (දී.නි. 3-256).

***තං කම්මං කුසලං තං කම්මං අනවජ්ජං තං කම්මං සුඛවිපාකං*** (එම කර්මය කුසලය. එම කර්මය අනවද්‍යයය. එම කර්මය සුඛ විපාක සහිත ය). (අ.නි. 1-470).

***කුසලං සුකතං සුඛං*** (මනාව කරන ලද කුසලය සැපය). (අභිධාප්පදීපිකා. 85-7).

## අකුසල

බෞද්ධ ආචාර දර්ශනයෙහි කුසල යන්නට ප්‍රතිපක්ෂ වූ ක්‍රියා හැඳින්වීම සඳහා අකුසල යන පදය යෙදී ඇත. ලෝභ, ද්වේෂ, මෝහ අකුසල වශයෙන් සංක්ෂේපයෙන් මහාවච්ඡගොත්ත සූත්‍රයේ දක්වා ඇත. මෙම ත්‍රිවිධ වූ අකුසල මූලික මනෝභාව වල පෙළඹවීමෙන් කායික වාචසික හා මානසික වශයෙන් ප්‍රකට වන සියලු ක්‍රියා පද අකුසල වශයෙන් සඳහන් වේ. නිර්වාණාබෝධය සඳහා ඉවහල්වන සියලුම ක්‍රියාකාරකම් කුසල වශයෙන් හඳුනා ගැණිනි. ඒ අනුව අකුසල යනු මුළුමනින්ම නිර්වාණාබෝධය වළක්වන හා එයට බාධාකරන සියලුම ආධ්‍යාත්මික මනෝභාව හා බාහිර චර්යාවන් වේ.

පුද්ගල සන්තානයේ ක්‍රියාත්මක වන පංච නීවරණ අකුසල මානසික ස්වභාව වේ. (අ.නි. 03. අකුසලරාසි සුත්ත; 102 පිට). මේවා නිරන්තරයෙන්ම ප්‍රඥාව දුර්වල කරන නිර්වාණාවබෝධයට බාධාකාරී අකුසල ධර්මයෝ වෙති. (ම.නි. 1, මහාතණ්හාසංඛය සුත්ත; පිට 630). ඉඳුරන් පිනවීම පිළිබඳ කැමැත්ත හා උනන්දුව (කාමච්ඡන්ද), ද්වේෂය මූලික කරගත් දැඩි අකමැත්ත හෙවත් ගැටීම (ව්‍යාපාද), කයෙහි හා

සිතිවිලිවල පවත්නා අකර්මන්‍ය බව හෙවත් ප්‍රමාදය හා අලස බව (ථීනමිද්ධ), නොසන්සුන් කම හා පසුතැවිලි (උද්ධච්චකුක්කුච්ච), සැක සංකා සහිත බව (විචිකිච්ඡා) යනාදිය නීවර්ණ ධර්මයෝ වෙති.

සූත්‍ර දේශනා තුළ අකුසල මනෝභාව හා චර්යා විවිධ ස්වරූපයෙන් විවරණය වී තිබේ. සල්ලේඛ සූත්‍රයේ අකුසල ධර්ම හතලිස් හතරක් පිළිබඳ දැක් වේ. (ම.නි. 1; සල්ලේඛ සුත්ත; පිට 96-102). එහි ඇති විශේෂත්වය වන්නේ අකුසලයෙහි ප්‍රතිවිරුද්ධ පක්‍ෂය ද විවිරණය කොට තිබීමයි. මීට අමතරව ධම්මදායාද සූත්‍රයේ ද අකුසල ධර්ම වශයෙන් ලෝභ, දෝස, කෝධ, උපනාහ, මක්ඛ, පලාස, ඉස්සා, මච්ඡරිය, මායා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මදය, පමාද යනුවෙන් ලක්‍ෂණ සොළොසක් දැක් වේ, (ම.නි. 1; ධම්මදායාද සුත්ත පිට 36). සූත්‍රවල දැක්වෙන අකුසල සහගත මානසික ස්වභාව විවරණය කිරීමෙන් පැහැදිලි වන්නේ ඒවා කොතරම් සියුම් හා ප්‍රබල ආකාරයෙන් දක්වා ඇත්තේ ද යන්නයි. එසේම කුසල සහගත මානසික ස්වභාවයන්ගේ ආධ්‍යාත්මික අගය මෙයින් තවදුරටත් පැහැදිලි වේ. ත්‍රිවිධ ද්වාරයෙන් පුද්ගලයා වරදට යොමුවන්නේ ඉහතින් දැක් වූ අකුසල මූලික මානසික ධර්ම වලින් ලැබෙන පෙළඹීම්වල ප්‍රතිඵලයක් වශයෙනි. එබැවින් මෙම විග්‍රහ මනෝවිද්‍යාත්මක මෙන් ම සමාජ විද්‍යාත්මක වශයෙන් ද වැදගත් වේ.

අකුසල පක්‍ෂයට අයත් කාම, ව්‍යාපාද, විහිංසා ආදි වූ විතර්ක ඉතිරි නොකොට සිතෙන් මුළුමනිම්ම ඉවත් කළ හැකි වන්නේ කුසල සංඛ්‍යාත සතර සතිපට්ඨාන ධර්ම ප්‍රගුණ කිරීමෙනි. (ස.නි. 3; පිණ්ඩොල්‍ය සුත්ත; පිට 158). එසේම සතර සතිපට්ඨානයට අයත් ධම්මානුපස්සනාව යටතේ චිත්ත සන්තානයේ පවතින අකුසල මානසික ස්වභාව හඳුනාගෙන ඒවා පාලනය කොට ගන්නා ආකාරය ද දක්වා ඇත.

අකුසල මනෝභාව කායික වාචසික හා මානසික චර්යා මඟින් ප්‍රකට වේ. ඒ අනුව දස අකුසල ධර්ම වශයෙන් දක්වන විවිධ හිංසන ක්‍රියා මූලික කරගත් ප්‍රාණඝාතය, ස්වකීය ආශාවන් සන්තර්පණය සඳහා අන්‍යයන් සතු දේපල සොරකම් කිරීම හා සම්බන්ධ අදත්තාදානය, ලිංගික ජීවිතයේ ඉන්ද්‍රිය සන්තුෂ්ටිය හා සම්බන්ධ සාවද්‍ය ලිංගික චර්යා හා බැඳුණු කාම මිථ්‍යාචාරය ආදිය අකුසල සහගත කායික චර්යාය. බොරුකීම, කේලාම් කීම, හිස්වචන කීම, පරුෂ වචන කීම ආදිය අකුසල සහගත වාචසික ක්‍රියාය. තෘෂ්ණාධික බව හෙවත් අභිධ්‍යාව, බද්ධ වෛරය හා සම්බන්ධ ව්‍යාපාදය, සදාචාර සම්පන්න භාවයට එරෙහිව වරදවාගත් විශ්වාසය හා බැඳුණු මිත්‍යා දෘෂ්ටිය ආදිය මානසික වශයෙන් ප්‍රකටවන චර්යාය.

මේ අනුව ලෝභය මූලික කරගෙන නොයෙක් පව්ටු අකුසල ධර්මයෝ පහළ වෙත්. යම් කෙනෙකු මෙසේ ලෝභ දෝස මෝහ ආදී සියලු අකුසල ධර්ම සම්පූර්ණයෙන්ම බැහැර කොට ඒවා නැවත හට නොගන්නා තත්ත්වයට පත්කොට වාසය කරන්නේ නම් ඔහු මෙලොවදීම කරදර බලවත් සිත් තැවුල් හා දැවිලි නැතිව සුවසේ වාසය කරයි. මෙලොවදීම පිරිනිවීමට පත්වෙයි. (අ.නි. 1, මහාවග්ග; පිට 356).

## සමාලෝචනය

බෞද්ධ ඉගැන්වීම් තුළ ආචාරවිද්‍යාත්මක අර්ථයකින් යෙදී ඇති පුඤ්ඤ-පාප, කුසල-අකුසල පද අතුරින් පුඤ්ඤ හා පාප පද ප්‍රාග් බෞද්ධ සමයේ පටන්ම යෙදී ඇති අතර ඒ තුළින් සදාචාරාත්මක මානව

චර්යා අර්ථවත් වී ඇත. කුසල අකුසල යන පදයන් බොහෝ සෙයින් හමුවන්නේ බෞද්ධ ඉගැන්වීම් තුළ ය. බෞද්ධ නිර්වාණ විග්‍රහය තුළ සුවිශේෂී වූ අර්ථයන් දැක්වීම සඳහා මෙම කුසල අකුසල පදයන් යෙදී ඇත. නමුත් අටුවා විවරණයන් තුළ ඇතැම් අවස්ථාවන්හි දී කුසල අකුසල පදයන්ට සමානව පුඤ්ඤ පාප පදයන් ද යෙදී ඇති අයුරු දැකගත හැකි බැවින් මෙහි ව්‍යවහාර්යන් පිළිබඳ නොයෙකුත් ගැටලු මතුවිණි. සමස්තයක් ලෙස අධ්‍යයනය කළ විට බුදුසමය තුළ කුසල අකුසල පදයන් යෙදෙනුයේ නිර්වාණය හා සම්බන්ධ කරුණු දැක්වීම සඳහා බව පෙනේ. ඒ අනුව කුසල යනු දක්ෂ භාවයයි. නැතහොත් හැකියාවයි. අකුසල යනු අදක්ෂභාවයයි. නැතහොත් නොහැකියාවයි. පුද්ගලයා දක්ෂභාවය ඇතිකරගත යුත්තේ විමුක්ති පිණිස බව බෞද්ධ ඉගැන්වීමයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


ස්දධාසේන, ඩී. (2004). *මුල්බුදුසමයෙන් ඉගැන්වෙන පාප සංකල්පය.* රත්න පොත් ප්‍රකාශකයෝ.

ආනන්ද හිමි, උඩුහාවර. (2009). *ආදි බුදුසමයේ දැක්වෙන පුඤ්ඤ සංකල්පය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කරුණාරත්න ඩබ්ලිව් එස් 1996 බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රීය ලේඛන සංග්‍රහය සංස් ඉන්දුමතී කරුණාරත්න කොළඹ

ගල්මන්ගොඩ සුමනපාල 1994 ආදි බෞද්ධ දර්ශනය මූලධර්ම විග්‍රහයක් අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ කඩවත

Dictionary of Pali and English, P.T.S.; "Punna"

Williams, Monier., Sanskrit English Dictionary; "Punnya"